ඉතාලිය

euaa
EUROPEAN UNION
AGENCY FOR ASYLUM

# නැවත පදිංචි කරවීම පිළිබඳ ව ඔබ දැනගත යුතු දේ

## ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ප්‍රතිලාභීන්



**සටහන.** මෙම විස්තර පත්‍රිකාවේ ඔබට වැදගත් වන තොරතුරු අඩංගු වේ. ඔබට නොවැටහෙන දෙයක් තිබේ නම්, ඔබට නිලධාරියෙකුගෙන් පැහැදිළි කරන ලෙස ඉල්ලා සිටිය හැකිය.

SINHALESE

## පටුන

නැවත පදිංචි කරවීම යනු කුමක්ද? 3

ඔබව තෝරා ගනු ලැබුවහොත්, ඔබව නැවත පදිංචි කරවනු ඇත්තේ කුමන රටේ ද? 4

ඔබව නැවත පදිංචි කරවීම සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔබෙන් අපේක්ෂා කරන්නේ කුමක්ද? 4

ඔබ සමඟ පවුලේ සාමාජිකයන් සිටී නම් කුමක් කළ යුතුද? 5

නැවත පදිංචි කරවීමට පෙර සම්මුඛ පරීක්ෂණයක් පවත්වනවා ද? 5

නැවත පදිංචි කරවීමෙන් පසු කුමක් සිදුවේ ද? 6

## නැවත පදිංචි කරවීම යනු කුමක්ද?

රටකට ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා එකවර අයදුම්පත් රාශියක් ලැබෙනවා නම් සහ එම රටට ඒවා හැසිරවිය නොහැකි නම්, වෙනත් රටවලට විවිධ ආකාරවලින් එම රටට සහාය විය හැකිය. රටවල් එකිනෙකාට සහයෝගය දැක්විය හැකි එක් ක්‍රමයක් වන්නේ ජාත්‍යන්තර ආරක්ෂාව ලබා දී ඇති පුද්ගලයින් (ජාත්‍යන්තර ආරක්ෂාවේ ප්‍රතිලාභීන් ලෙස ද හැඳින්වේ) වෙනත් රටකට මාරු කර යැවීමට භාර ගැනීමයි. මෙය නැවත පදිංචි කරවීම ලෙස හැඳින්වේ.



පසුගිය වසර තුන තුළ ජාත්‍යන්තර ආරක්ෂාව ලබා දී ඇති පුද්ගලයින් පමණක් නැවත පදිංචි කරවීම සඳහා සුදුසුකම් ලබයි.

මෙම තත්ත්වය ඇති වුවහොත්, ඔබව වෙනත් රටකට මාරු කර යැවිය හැකිය. වෙනත් රටවල නැවත පදිංචි කරවීම් සඳහා දැනට සහභාගී විය හැක්කේ EU+ රටවල් 26 කට පමණි.

**වැදගත්! ඔබ දැන් ඉතාලිය හි සිටින අතර, එය EU රටකි.**

දැනට නැවත පදිංචි කරවීම සඳහා සහභාගී විය හැකි EU+ රටවල් 26 නම්: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටා, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය සහ ස්වීඩනය.

දැනට නැවත පදිංචි කරවීම සඳහා සහභාගී නොවන "හවුල්" රටවල් 5 සහ අනෙකුත් ප්‍රාන්ත වන්නේ: ඩෙන්මාර්කය, අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ සහ ස්විට්සර්ලන්තය.

## ඔබව තෝරා ගනු ලැබුවහොත්, ඔබව නැවත පදිංචි කරවනු ඇත්තේ කුමන රටේ ද?

නැවත පදිංචි කරවිය හැක්කේ කවුරුන්ද යන්න බලධාරීන් විසින් තීරණය කරනු ඇත.

ඔබව නැවත පදිංචි කරවීම සඳහා තෝරාගනු ලැබුවහොත්, ඔබව වෙනත් රටකට මාරු කර යවන්නේ ඔබ ඒ සඳහා කැමැත්ත පළ කළහොත් පමණි.

**වැදගත්!** ඔබව නැවත පදිංචි කරවන්නේ කුමන රටේ ද යන්න ඔබට තෝරාගත නොහැකිය.

## ඔබව නැවත පදිංචි කරවීම සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔබෙන් අපේක්ෂා කරන්නේ කුමක්ද?



ඔබ නැවත පදිංචි කරවීම සඳහා තෝරා ගනු ලැබුවහොත් සහ එම රටට මාරු කර යැවීමට ඔබේ කැමැත්ත ලබා දෙන්නේ නම්, ඔබ පහත සඳහන් දේ කළ යුතුය:

- බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කර ඔවුන්ගේ උපදෙස් පිළිපදින්න
- ඔබේ ගමනේ දිනය තෙක් මෙම රට තුළ රැඳී සිටින්න, සහ බලධාරීන්ට ඔබ වෙත ළඟා වීමට හැකි විය යුතුය.

## ඔබ සමඟ පවුලේ සාමාජිකයන් සිටී නම් කුමක් කළ යුතුද?

ඔබ දැනට ඔබේ සමීප පවුලේ සාමාජිකයන් සමඟ සිටින අතර ඔවුන් ජාත්‍යන්තර ආරක්ෂාවේ ප්‍රතිලාභීන් ද වේ නම් සහ ඔබ නැවත පදිංචි කරවීම සඳහා තෝරාගෙන තිබේ නම්, ඔබේ පවුලේ අය ද ඔවුන්ගේ කැමැත්ත ලබා දෙන්නේ නම්, ඔවුන් ඔබ සමඟ නැවත පදිංචි කරවනු ඇත.

සමීප පවුලේ සාමාජිකයන් ලෙස සැලකෙන්නේ:



- ඔබේ සැමියා හෝ බිරිඳ
- ඔබ ස්ථිර සම්බන්ධතාවයක් බෙදා ගන්නා ඔබේ අවිවාහක සහකරු



- ඔබේ දරුවා (වයස අවුරුදු 18 ට අඩු සහ අවිවාහක).

## නැවත පදිංචි කරවීමට පෙර සම්මුඛ පරීක්ෂණයක් පවත්වනවා ද?



ඔබෙන් තවත් තොරතුරු අවශ්‍ය නම්, සම්මුඛ පරීක්ෂණයක් පිළියෙළ කරනු ඇත. එය ආරක්ෂාව සම්බන්ධ කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ඇත. ඔබට එවැනි සම්මුඛ පරීක්ෂණයකට යාමට අවශ්‍ය නම්, බලධාරීන් ඔබට ඒ පිළිබඳ ව කලින් විස්තර ලබා දෙනු ඇත.

## නැවත පදිංචි කරවීමේ ක්‍රියාවලියට කොපමණ කාලයක් ගතවේ ද?




ඔබව වෙනත් රටක නැවත පදිංචි කරවීමට ඉල්ලීමක් යවනු ලැබුවහොත්, එම රට සතියක් හෝ දෙකක් ඇතුළත මෙම ඉල්ලීම සම්බන්ධව තීරණයක් ගත යුතුය.

ඉල්ලීම පිළිගනු ලැබුවහොත්, එම රට වෙත ඔබේ මාරු කර යැවීම සති හතරක් ඇතුළත සංවිධානය කරනු ඇත.

අවම වශයෙන් සතියකට පෙර මාරු කර යැවීම පිළිබඳ ව ඔබට දැනුම් දෙනු ඇත.

රට ඉල්ලීම පිළි නොගන්නේ නම්, ඔබ මේ රට තුළ රැඳී සිටිනු ඇත.

## නැවත පදිංචි කරවීමෙන් පසු කුමක් සිදුවේ ද?

ඔබව වෙනත් රටක නැවත පදිංචි කරවනු ලැබුවහොත්, ජාත්‍යන්තර ආරක්ෂාවේ ප්‍රතිලාභියෙකු ලෙස ඔබේ අයිතීන් ස්වයංක්‍රීයව එම රටට මාරු කර යවනු ඇත.

## මගේ සටහන්

මෙම විස්තර පත්‍රිකාව තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමගින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම ලේඛනයේ ප්‍රධාන කොටස සපයා ඇත්තේ යුරෝපීය සංගමයේ රැකවරණය සඳහා වූ ආයතනය (EUAA) විසින් වන අතර, මෙම විස්තර පත්‍රිකාව පිටපත් කිරීම සහ වෙනස් කිරීම සඳහා EUAA විසින් අවසර දී ඇත්තේ EU සාමාජික රටවල් සඳහා පමණි. මෙම විස්තර පත්‍රිකාවේ ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාවය, අන්තර්ගතය, පරිපූර්ණත්වය, නීත්‍යානුකූලභාවය හෝ විශ්වසනීයත්වය සඳහා EU සාමාජික රටවල හෝ වෙනත් වගකිවයුතු තෙවන පාර්ශවයක කිසිදු වගකීමක් හෝ වගවීමක් EUAA විසින් පිළි නොගැනේ. මෙම විස්තර පත්‍රිකාවේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025